# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2325/41 - 2023 මාර්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වගන්තිය යටතේ කරනු ලබන නියමයයි

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 223 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් නියමය මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

මාලිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

**නියමය**

1. මධ්‍යම පළාතේ මහජනතාව සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස පානීය ජලය භාවිතයට ගැනීමට හැකිවන පරිදි පානීය ජල සුරක්ෂිතතාව තිරසාරව පවත්වාගැනීම වෙනුවෙන්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ජල මූලාශ්‍ර විධිමත්ව පවත්වාගැනීමෙහිලා ප්‍රාදේශීය සභා මැදිහත්වීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද, මධ්‍යම පළාතේ සෑම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් තුළ ඊට අදාළව ක්‍රියාත්මක විය යුතු ප්‍රතිපත්තිය නිශ්චය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, එවැනි ප්‍රතිපත්තියක් යටතේ පානීය ජල සුරක්ෂිතතාවය පවත්වා ගැනීමෙහිලා අවශ්‍ය නියාමනයන් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින්ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ පිහිටි ජල මූලාශ්‍ර ඇතුළු ජලය බෙදාහැරීමේ ක්‍රමෝපායන් විධිමත් කිරීමට හැකිවන පරිදි ප්‍රාදේශීය සභා වෙත ප්‍රමාණවත් විධිවිධාන සලස්වනු පිණිස මෙම නියමය සිදු කරනු ලබයි.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. මධ්‍යම පළාත තුළ සෑම ප්‍රාදේශීය සභාවක් විසින්ම තම බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මහජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා යොදා ගත හැකි ජල මූලාශ්‍ර පිළිබඳව නිසි සංගණනයක් සිදුකර ඊට අදාලව පහත කරුණු තහවුරු වන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතුය.

   i. ජල මූලාශ්‍රයේ නම
   ii. පිහිටීම
   iii. ග්‍රාම නිලධාරි වසම
   iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
   v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
   vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
   vii. පරිහරණ ස්වභාවය (පෞද්ගලික/පොදු)

3. ඉහත වගන්තිය යටතේ විස්තර කරනු ලබන මධ්‍යම පළාත යටතේ පවත්වාගෙන යනු ලබන්නා වූ පානීය ජල අවශ්‍යතාවය සඳහා භාවිතයට ගැනෙන ජල මූලාශ්‍ර අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සම්බන්ධයෙන් ද, කිසියම් ජල මූලාශ්‍රයක් වෙතින් මිනිස් පරිභෝජනය සඳහා පිටතට ගැනෙන ජලය පරිභෝජනයට ගැනීම දක්වා වූ කටයුතු විධිමත් කිරීම සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය හැර වෙනත් කවර හෝ ආයතනයක්, පුද්ගලයෙක් හෝ සංවිධානයක් විසින් කිසියම් ජල මූලාශ්‍රයක් භුක්ති විඳීමේ දී ජලය එක්රැස් කිරීමේ දී, ජලය බෙදා හැරීමේ දී බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ පානීය ජල සුරක්ෂිතතාවය නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානයන්ට යටත්ව සෑම ප්‍රාදේශීය සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය යුතුය.

4. සෑම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශක පිහිටියා වූ හා ඉහත 2 වන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව විසින් හඳුනාගනු ලැබූ වූ පානීය ජල මූලාශ්‍රයන්ට අදාළව ජල සුරක්ෂිතතාවය සහතික වනු පිණිස ඒ ඒ ප්‍රාදේශීය සභා විසින් කලින් කල ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම පිණිස හා ඊට අදාල ප්‍රාදේශීය සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම පිණිස පහත අයවලුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටු විය යුතුය.

- මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්
- මධ්‍යම පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්
- මධ්‍යම පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
- මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්
- මධ්‍යම පළාතේ ඉඩම් කොමසාරිස්
- මධ්‍යම පළාතේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
- ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ මධ්‍යම පළාත භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

   i. මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් නිල බලයෙන් මෙම වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුවේ සභාපති විය යුතු අතර, මධ්‍යම පළාතේ පළාතේ පළාත් පාලන කොමසාරිස් නිල බලයෙන් කමිටුවේ ලේකම් විය යුතුය.

   ii. ඉහත කමිටුව අවම වශයෙන් මාස 06කට වරක් රැස්විය යුතු අතර, අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් කමිටු සභාපතිවරයා විසින් කමිටුව කැඳවීම සිදුකළ හැක.

5. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය විධිමත් කිරීම, ඊට අදාළ සුබවිහරණය සැලසීම පිණිස පානීය ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය සභාවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්තීන් පිළිබඳව මෙම නියමයේ 4 වන වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුව විසින් ප්‍රාදේශීය සභාව වෙත ලබාදෙන උපදෙස් මෙම නියමයේම කොටසක් වශයෙන් සලකා ප්‍රාදේශීය සභා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

6. ජල මූලාශ්‍රයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හා ඊට අදාල භාවිතයන් සම්බන්ධයෙන් මෙන්ම ජල මූලාශ්‍රයක් වෙතින් ජලය පිටතට ගෙන භාවිතයේ යොදවන සෑම ක්‍රියාකාරකමටම අදාළව සාදනු ලබන අතුරු ව්‍යවස්ථා හා උපදෙස් අවස්ථාවෝචිත පරිදි නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ විධිවිධාන, නාගරික සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන, ළිං හා වලවල් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ විධිවිධාන සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානයන්ට අතිරේකව හා අනුකූලව අදාළ විය යුතුය.

7. මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG - 03 -0363

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

**1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා පනතේ 247 වගන්තිය යටතේ කරනු ලබන නියමයයි**

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික විධිවිධාන) පනතේ 2වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 247 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් නියමය මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

මාලිගා චතුරස්‍රය,
මහනුවර දී ය.

***නියමය***

1. මධ්‍යම පළාතේ මහජනතාව සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස පානීය ජලය භාවිතයට ගැනීමට හැකිවන පරිදි පානීය ජල සුරක්ෂිතතාව තිරසාරව පවත්වාගැනීම වෙනුවෙන්, නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ජල මූලාශ්‍ර විධිමත්ව පවත්වා ගැනීමෙහිලා නගර සභා මැදහත්වීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද, මධ්‍යම පළාතේ සෑම නගර සභා බල ප්‍රදේශයක් තුළ ඊට අදාළව ක්‍රියාත්මක විය යුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, එවැනි ප්‍රතිපත්තියක් යටතේ පානීය ජල සුරක්ෂිතතාවය පවත්වා ගැනීමෙහිලා අවශ්‍ය නියාමනයන් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ජල මූලාශ්‍ර ඇතුළු ජලය බෙදාහැරීමේ ක්‍රමෝපායන් විධිමත් කිරීමට හැකි වන පරිදි නගර සභා වෙත ප්‍රමාණවත් විධිවිධාන සලස්වනු පිණිස මෙම නියමය සිදු කරනු ලබයි.

2 මධ්‍යම පළාත තුළ සෑම නගර සභාවක් විසින්ම තම බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මහජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා යොදා ගත හැකි ජල මූලාශ්‍ර පිළිබඳව නිසි සංගණනයක් සිදුකර ඊට අදාළව පහත කරුණු තහවුරු වන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරි වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාව (පෞද්ගලික/පොදු)

3. ඉහත වගන්තිය යටතේ විස්තර කරනු ලබන මධ්‍යම පළාත යටතේ පවත්වාගෙන යනු ලබන්නා වූ පානීය ජල අවශ්‍යතාවය සඳහා භාවිතයට ගැනෙන ජල මූලාශ්‍ර අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සම්බන්ධයෙන් ද, කිසියම් ජල මූලාශ්‍රයක් වෙතින් මිනිස් පරිභෝජනය සඳහා පිටතට ගැනෙන ජලය පරිභෝජනයට ගැනීම දක්වා වූ කටයුතු විධිමත් කිරීම සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය හැර වෙනත් කවර හෝ ආයතනයක්, පුද්ගලයෙක් හෝ සංවිධානයක් විසින් කිසියම් ජල මූලාශ්‍රයක් භුක්ති විඳීමේ දී ජලය එක්රැස් කිරීමේ දී, ජලය බෙදා හැරීමේ දී බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ පානීය ජල සුරක්ෂිතතාවය නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ විධිවිධානයන්ට යටත්ව සෑම නගර සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය යුතුය.

4 සෑම නගර සභා බල ප්‍රදේශයක පිහිටියා වූ හා ඉහත 2 වන වගන්තිය යටතේ නගර සභාව විසින් හඳුනාගනු ලැබුවා වූ පානීය ජල මූලාශ්‍රයන්ට අදාළව ජල සුරක්ෂිතතාවය සහතික වනු පිණිස ඒ ඒ නගර සභා විසින් කලින් කල ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්තීන්

පිළිබඳව නගර සභාවට උපදෙස් දීම පිණිස හා ඊට අදාළ නගර සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම පිණිස පහත අයවලුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටු විය යුතුය.

- මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්
- මධ්‍යම පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්
- මධ්‍යම පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
- මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්
- මධ්‍යම පළාතේ ඉඩම් කොමසාරිස්
- මධ්‍යම පළාතේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
- ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මධ්‍යම පළාත භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

i. මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් නිල බලයෙන් මෙම වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුවේ සභාපති විය යුතු අතර, මධ්‍යම පළාතේ පළාතේ පළාත් පාලන කොමසාරිස් නිල බලයෙන් කමිටුවේ ලේකම් විය යුතුය.

ii. ඉහත කමිටුව අවම වශයෙන් මාස 06කට වරක් රැස්විය යුතු අතර, අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් කමිටු සභාපතිවරයා විසින් කමිටුව කැඳවීම සිදුකළ හැක.

5. නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය විධිමත් කිරීම, ඊට අදාළ සුඛවිහරණය සැලසීම පිණිස පානීය ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අදාළ නගර සභාවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්තීන් පිළිබඳව මෙම නියමයේ 4 වන වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුව විසින් නගර සභාව වෙත ලබාදෙන උපදෙස් මෙම නියමයේම කොටසක් වශයෙන් සලකා නගර සභා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

6. ජල මූලාශ්‍රයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හා ඊට අදාළ භාවිතයන් සම්බන්ධයෙන් මෙන්ම ජල මූලාශ්‍රයක් වෙතින් ජලය පිටතට ගෙන භාවිතයේ යොදවන සෑම ක්‍රියාකාරකමකටම අදාළව සාදනු ලබන අතුරු ව්‍යවස්ථා හා උපදෙස් අවස්ථාවෝචිත පරිදි නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන, නාගරික සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන, ළිං හා වලවල් පිළිබඳ ආඥා පනතේ විධිවිධාන, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ විධිවිධාන සහ 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ විධිවිධානයන්ට අතිරේකව හා අනුකූලව අදාළ විය යුතුය.

7 මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG - 03 -0363/1

**මධ්‍යම පළාතේ පළාත් සභාව**

අතුරු ව්‍යවස්ථා

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන)පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ කරනු ලබන නියමය

මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවර නීතිඥ ලලිත් යූ. ගමගේ වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් නියමය මෙයින් ප්‍රකාශයට පත් කරන බව නිවේදනය කරමි.

**නීතිඥ ලලිත් යූ. ගමගේ,**
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර.

මාලිගා චතුරස්‍රය,
මහනුවරදී ය.

***නියමය***

1. මධ්‍යම පළාතේ මහජනතාව සඳහා සෞඛ්‍ය ආරක්ෂිත ලෙස පානීය ජලය භාවිතයට ගැනීමට හැකිවන පරිදි පානීය ජල සුරක්ෂිතතාව තිරසාරව පවත්වාගැනීම වෙනුවත්, මහා නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ජල මූලාශ්‍ර විධිමත්ව පවත්වාගැනීමෙහිලා මහා නගර සභා මැදිහත්වීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද, මධ්‍යම පළාතේ සෑම මහා නගර සභා බල ප්‍රදේශයක් තුළ ඊට අදාළව ක්‍රියාත්මක විය යුතු ප්‍රතිපත්තිය නිශ්චය කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, එවැනි ප්‍රතිපත්තියක් යටතේ පානීය ජල සුරක්ෂිතතාවය පවත්වා ගැනීමෙහිලා අවශ්‍ය නියාමනයන් සිදුකිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇති හෙයින් ද, මහා නගර සභා බල ප්‍රදේශ තුළ පිහිටි ජල මූලාශ්‍ර ඇතුළු ජලය බෙදාහැරීමේ ක්‍රමෝපායන් විධිමත් කිරීමට හැකිවන පරිදි මහා නගර සභා වෙත ප්‍රමාණවත් විධිවිධාන සලස්වනු පිණිස මෙම නියමය සිදු කරනු ලබයි.

2 මධ්‍යම පළාත තුළ සෑම මහා නගර සභාවක් විසින්ම තම බල ප්‍රදේශය තුළ පිහිටියා වූ මහජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සඳහා යොදා ගත හැකි ජල මූලාශ්‍ර පිළිබඳව නිසි සංගණනයක් සිදුකර ඊට අදාළව පහත කරුණු තහවුරු වන පරිදි තොරතුරු පවත්වාගෙන යා යුතුය.

i. ජල මූලාශ්‍රයේ නම
ii. පිහිටීම
iii. ග්‍රාම නිලධාරී වසම
iv. ස්ථානය පිහිටීමේ ඛණ්ඩාංක
v. ජල මූලාශ්‍රය පිහිටි භූමියේ අයිතිය/භුක්තිය
vi. ප්‍රවේශය (හැකිතාක් දළ සැළැස්මකින් නිරූපනය කළ යුතුය)
vii. පරිහරණ ස්වභාව (පෞද්ගලික/පොදු)

3. ඉහත වගන්තිය යටතේ විස්තර කරනු ලබන මධ්‍යම පළාත යටතේ පවත්වාගෙන යනු ලබන්නා වූ පානීය ජල අවශ්‍යතාවය සඳහා භාවිතයට ගැනෙන ජල මූලාශ්‍ර අධීක්ෂණය කිරීම, විධිමත් කිරීම සම්බන්ධයෙන් ද, කිසියම් ජල මූලාශ්‍රයක් වෙතින් මිනිස් පරිභෝජනය සඳහා පිටතට ගැනෙන ජලය පරිභෝජනයට ගැනීම දක්වා වූ කටයුතු විධිමත් කිරීම සඳහා ද ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය හැර වෙනත් කවර හෝ ආයතනයක්, පුද්ගලයෙක් හෝ සංවිධානයක් විසින් කිසියම් ජල මූලාශ්‍රයක් භුක්ති විඳීමේ දී ජලය එක්රැස් කිරීමේ දී, ජලය බෙදා හැරීමේ දී බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ පානීය ජල සුරක්ෂිතතාවය නිසියාකාරව පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස 252 අධිකාරය වන නගර සභා ආඥා පනතේ විධිවිධානයන්ට යටත්ව සෑම මහා නගර සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය යුතුය.

4 සෑම මහා නගර සභා බල ප්‍රදේශයක පිහිටියා වූ හා ඉහත 2 වන වගන්තිය යටතේ මහා නගර සභාව විසින් හඳුනාගනු ලැබුවා වූ පානීය ජල මූලාශ්‍රයන්ට අදාළව ජල සුරක්ෂිතතාවය සහතික වනු පිණිස ඒ ඒ මහා නගර සභා විසින් කලින් කල ක්‍රියාත්මක කළ

යුතු ප්‍රතිපත්තීන් පිළිබඳව මහා නගර සභාවට උපදෙස් දීම පිණිස හා ඊට අදාළ මහා නගර සභාවේ කටයුතු අධීක්ෂණය කිරීම පිණිස පහත අයවලුන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටු විය යුතුය.

- මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්
- මධ්‍යම පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්
- මධ්‍යම පළාතේ පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
- මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්
- මධ්‍යම පළාතේ ඉඩම් කොමසාරිස්
- මධ්‍යම පළාතේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන්
- ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ මධ්‍යම පළාත භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි

i. මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම් නිල බලයෙන් මෙම වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුවේ සභාපති විය යුතු අතර, මධ්‍යම පළාතේ පළාතේ පළාත් පාලන කොමසාරිස් නිල බලයෙන් කමිටුවේ ලේකම් විය යුතුය.

ii. ඉහත කමිටුව අවම වශයෙන් මාස 06කට වරක් රැස්විය යුතු අතර, අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් කමිටු සභාපතිවරයා විසින් කමිටුව කැඳවීම සිදුකළ හැක.

5. මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවගේ මහජන සෞඛ්‍ය විධිමත් කිරීම, ඊට අදාළ සුබවිහරණය සැලසීම පිණිස පානීය ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අදාළ මහ නගර සභාවන් විසින් ක්‍රියාත්මක කළ යුතු ප්‍රතිපත්තීන් පිළිබඳව මෙම නියමයේ 4 වන වගන්තිය යටතේ පත්කරනු ලබන කමිටුව විසින් නගර සභාව වෙත ලබාදෙන උපදෙස් මෙම නියමයේම කොටසක් වශයෙන් සලකා මහ නගර සභා විසින් ක්‍රියාත්මක කළ යුතුය.

6. ජල මූලාශ්‍රයන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හා ඊට අදාළ භාවිතයන් සම්බන්ධයෙන් මෙන්ම ජල මූලාශ්‍රයක් වෙතින් ජලය පිටතට ගෙන භාවිතයේ යොදවන සෑම ක්‍රියාකාරකමකටම අදාළව සාදනු ලබන අතුරු ව්‍යවස්ථා හා උපදෙස් අවස්ථාවෝචිත පරිදි නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන, නාගරික සංවර්ධන අධිකාරිය පනතේ විධිවිධාන, ළිං හා වලවල් පිළිබඳ ආඥාපනතේ විධිවිධාන, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ විධිවිධාන සහ 252 අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ විධිවිධානයන්ට අතිරේකව හා අනුකූලව අදාළ විය යුතුය.

7 මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර අනනුකූලතාවයක් හටගතහොත් සිංහල පාඨය ප්‍රමුඛ වේ.

EOG - 03 -0363/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.